**ශීර්ෂය 176 - වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

---

1.1 **තත්ත්වාගණනය කල මතය**

---

වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1 ) (ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

**-----------------------------------------------------------**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**---------------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමක් කල නොහැකිවූ අතර මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශද මෙම වාර්තාවෙන් ඉදිරිපත් කර නොමැත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගෙ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | අමාත්‍යාංශය විසින් ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම යටතේ 2017 හා 2018 වර්ෂවලදී ආරම්භ කර තිබුණද වැඩ අවසන්කර නොතිබුණු ව්‍යාපෘති 02 කට අදාළ රු.62,061,465ක් කෙරීගෙන යන වැඩ ලෙස මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක: 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව හා ගිණුම්කරණ මූලධර්ම අනුව නිවැරදි තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කිරීමට කටයුතු කල යුතුය. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට 2019 වර්ෂයෙ සිට කටයුතු කිරීමට සටහන කරගත් අතර අදාල නිලධාරීන්ට උපදෙස් දුනි. |
| (ii) | මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂය රු. 232,863,367 ක් වුවත් එම ශේෂය මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ රු. 266,621,052 ක් ලෙස රු. 33,757,685 ක් වැඩියෙන් දක්වා තිබුණි. මෙම වෙනස සඳහා හේතු විගණනයට ඉදිරිපත් නොවුණි. | නිවැරදි අගයන් ගිණුම්වල ඇතුළත් කිරීමට කටයුතු කල යුතුය. | -එම- |
| (iii) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශන අනුව වාහනවල හා යන්ත්‍ර හා උපකරණවල අගය පිළිවෙලින් රු. 248,915,208 ක් හා රු. 21,270,663 ක් වුවද උපලේඛණ අනුව රු. 267,319,644 ක් හා රු. 17,193,634 ක් වූයෙන් මූල්‍ය ප්‍රකාශන හා උපලේඛණ අතර රු. 22,481,465ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශවල සඳහන් ශේෂයන් විස්තරාත්මක උපලේඛණ සමඟ එකඟ වන පරිදි සකස් කල යුතුය. | -එම- |

**(ආ) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගෙ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **(i)** | වර්ෂය තුල රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ලැබීම් රු. 6,027,886 ක් අඩුවෙන් සහ වෙනත් ලැබීම් රු. 4,205,860ක් වැඩියෙන් දැක්වීම හේතුවෙන් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් රු. 1,822,026 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක: 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය . | 2018 නොවැම්බර් 21 දිනැ අංක 267/2018 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර ගිණුම් පිළියෙල කිරීමට 201 වර්ෂයේ සිට කටයුතු කිරීම සටහන් කරගත් අතර අදා නිලධාරින්ට උපදෙස් දුනි. |
| **(ii)** | මූල්‍ය ප්‍රකාශන අනුව අත්තිකාරම් ගෙවීම් රු. 8,177,719 ක් වුවත් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ රු. 5,511,133 ක් ලෙස දැක්වීම හේතුවෙන් අත්තිකාරම් ගෙවීම් රු. 2,666,586 කින් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| **(iii)** | අග්‍රිම ගැලපුම් ගිණුම පිළියෙල කර තිබුණද එයට බලපත්‍ර හා වෙනත් ආදායම් යටතේ එකතුකර භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබූ රු.101,036,857 ක් ඇතුළත් කර නොතිබුණි. සාක්ෂි මඟින් තහවුරු නොකරන ලද රු. 5,369,898 ක් වෙනත් දෙපාර්තමේන්තු විසින් රැස්කල ආදායම් ලෙස ගැලපුම් ගිණුමේ දක්වා තිබුණි. | -එම- | -එම- |
| **(iv)** | මාසික ගිණුම් සාරාංශ අනුව අමාත්‍යාංශය විසින් වෙනත් දෙපාර්තමේන්තු/ අමාත්‍යාංශ වෙනුවෙන් දරා තිබුණු වියදම රු. 2,344,210 ක් වුවත් ගැලපුම් ගිණුමෙහි එම ප්‍රමාණය රු.738,065 ක් ලෙස රු.1,606,145 ක් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| **(v)** | භාණ්ඩාගාර පොත් හා අමාත්‍යාංශ පොත් අතර අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් වල පැවති පිළිවෙලින් රු.701,868 ක් හා රු.11,500 ක්වූ වෙනස්කම් ගැලපුම් ගිණුම සකස් කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි. | -එම- | -එම- |

## 1.6.2. **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **(i)** | අමාත්‍යාංශයෙන් බාහිර ආයතන වෙත ස්ථාන මාරුවී ගිය නිලධාරින් 6 දෙනකුගෙන් අයවිය යුතු රු. 462,459 ක් වර්ෂ 15 ක කාලයක් තිස්සේ අයකරගෙන නොතිබුණි. තවද වැඩ තහනම් කල හා සේවය හැරගිය සේවකයන් 2 ගෙන් පිලිවෙලින් අය විය යුතු රු. 293,470 ක් හා රු. 21,140 ක් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ **XXIV** වැනි පරිච්ඡේදයේ 1.6, 1.7 හා 6.3 වගන්ති හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1 ජේදය සහ 2015 ඔක්තෝබර් 09 දිනැති අංක පීඑෆ්ඩී/ආර්ඊඩී/2015/**08**පොදු**(i)** දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ජේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | නිලධාරින් 6 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 462,583 ක් වූ ණය ශේෂ 1990 දශකය තරම් පැරණිය. මෙම ණය ශේෂ කපා හැරීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කර ඇත. වැඩ තහනමට ලක්වී ඇති සේවකයකුට නඩු පැවරීමෙන් පසුව ලබා දුන් තීන්දුව මත එම නිලධාරියා අභියාචනාධිකරණයේ නඩුවක් ගොනුකර ඇත ඊට ලැබෙන තීන්දුව මත පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කල හැකිය. අයවිය යුතු රු. 21,140 ක මුදල දශකයකට වඩා පැරණි බැවින් මෙම ණය මුදල අයකර ගැනීම පිළිබඳ ප්‍රගතියක් පෙන්වීම අපහසු බව දැන්වීමට කැමැත්තෙමි. |

**1.6.3. ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වා ගෙන යනු ලැබේ.මෙහි ලිඛිත සමාලෝචනයක් සිදුකර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තිය ප්‍රකාරව 2019 වර්ෂයේ සිට කටයුතු කරනු ලැබේ. |

**1.6.4. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නිරීක්ෂණය | | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | - | චක්‍රලේඛය අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලසුමට අන්තර්ගත කළ යුතු වූ වාර්ෂික අක් මුදල් අවශ්‍යතා සැලසුම, යාවත්කාලීන කළ අමාත්‍යාංශයේ හා නාවික ලේකම් | චක්‍රලේඛයේ දැක්වෙන අවශ්‍යතා අනුව කටයුතු කළ යුතුය. | 2019 වර්ෂය සඳහා විගණනයෙන පෙන්වා ඇති අඩුපාඩු සකස සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මක සකස් කරනු ලැබේ. |

කාර්යාලයේ සංවිධාන ව්‍යුහය හා කාර්ය මණ්ඩල විස්තර වාර්තා හා සැලසුම් ඇතුලත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය
---------------------

### 2.1 අග්‍රිම කළමනාකරණය
-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශය සැලසුම් කල පරිදි භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලැබී නොතිබුණි. 2018 අවසාන කාර්තුවේ රු.මිලියන 1,413 ක් ඉල්ලුම් කලද ලබාදුන් අග්‍රිමය රු.මිලියන 329 ක් වූ අතර එහි ප්‍රතිශතය සියයට 23 ක් විය. ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන ප්‍රසස්ථ ලෙස උපයෝජනය කල නොහැකිවී තිබුණි. | ක්‍රියාකාරී සැළසුමට අනුගතව නිශ්චිත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ හැකිවන පරිදි අග්‍රිම ඉල්ලුම් කිරීමේදී සැළසුමක් පිළියෙලකර ඉදිරිපත්කර ක්‍රියාත්මක කළ යුතුය. | මුල් කාර්තු 03 ඇතුලත ඉල්ලුම් කරන ලද අග්‍රිමයෙන් මුදල් නොලැබුනු ප්‍රමාණය අවසන් කාර්තුවේ අග්‍රි ඉල්ලුම් කිරීමේදී ඇතුලත් කරන ලදී එබැවින් පාර්ලිමේන්තුව විසින් සලසා තිබූ ප්‍රතිපාදන උපයෝජනය නොකිරීමට හේතුවී ඇත. |

### 2.2 වියදම් කළමනාකරණය
-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **මු.රෙ. 66 යටතේ මාරුකරගත් ප්‍රතිපාදන ඉතිරිවීම්**<br>---<br>අමාත්‍යාංශ විෂය පථයට අයත් නොවූ සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා ලබාගත් ණය මුදල් පියවීම සඳහා වෙනත් මූලධන වැය විෂයයන්ගෙන් මු.රෙ.66 යටතේ රු.650,000,000 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණද | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතුයි. | අවශ්‍යතාවය අනුව 176-2-4-26-2509 වැය විෂය සඳහා මු.රෙ.66 යටතේ ප්‍රතිපාදන මාරුකර ගැනීම සිදු කල වියදම් දැරීම සඳහා මහ භාණ්ඩාගාරයෙන් අක්මුදල් සපයා ගැනීමට නොහැකිවීම මත ප්‍රතිපාදන ඉතිරිවී ඇති අතර එම මුදල 2018 වර්ෂයේ බැදීමක් ලෙස දක්වා ඇත. |

| | | |
|---|---|---|
| එසේ මාරු කරගත් සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.<br>කෙසේ වුවද එම ණය මුදල සඳහා වූ පොළී ගෙවීම සඳහා පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන මත රු. 278,835,112 ක් 2018 නොවැම්බර් 28 දින අමාත්‍යාංශය විසින් මහජන බැංකුව වෙත ගෙවා තිබුණි. | | |

(ආ) **ප්‍රතිපාදනය උපයෝජනය නොකිරීම හෝ ඌණ උපයෝජනය කිරීම**

**-----------------------------------------**

| | | |
|---|---|---|
| ප්‍රාග්ධන වැය විෂයයන් 10 ක රු. 67,404,416 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණු අතර, එහි ප්‍රතිශතය සියයට 25 ත් සියයට 100 ත් අතර පරාසයක විය. ප්‍රාග්ධන වැය විෂයයන් 05 ක් සඳහා වෙන්කල රු. 2,270,000,000 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. පුනරාවර්තන වැය විෂයයන් 06 ක රු. 13,059,336 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණ අතර එහි ප්‍රතිශතය සියයට 29 ත් සියයට 60 ත් අතර පරාසයක විය. | මු.රෙ. 50 හි සඳහන් නියමයන්ට අනුකූලව ඇස්තමේන්තු පිළියෙල කර වාර්ෂික වියදම් දැරිය යුතුය. | බොහෝ වැය විෂයයන්වල අපේක්ෂිත වියදම් ඇති නොවීම යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමේදී රුපියල අවප්‍රමාණ වීම ඇණවුම් කරන ලද භාණ්ඩ නොලැබීම, හා වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ අපේක්ෂා කල පරිදි පුහුණු වැඩ සටහන් පැවැත්වීමට නොහැකිවීම එම වැය විෂයයන්වල ප්‍රතිපාදන ඉතිරිවීමට හේතුවී ඇත. |

**2.3. බැරකම් හා බැඳීම්වලට එළඹීම**

**----------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ප්‍රතිපාදනය ඉක්මවා බැරකම්වලට එළඹීම<br>-------------------------------------------- | | |
| වැය විෂයයන් 4 කට අදාලව සලසා තිබුණු ප්‍රතිපාදනය ඉක්මවා රු. 3,023,031 ක බැරකම්වලට එළඹ තිබුණි. | මු.රෙ. 94 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව ඇස්තමේන්තු ප්‍රතිපාදන නොමැතිව බැරකම් වලට නොඑළඹිය යුතුය. | ගෙවීම් සඳහා ඉදිරිපත් කර තිබු වවුචර් බැරකම් ලේඛණයට ඇතුලත් කළ New Cigas වෙබ් පිටුව වෙත උඩුගත (Upload) කිරිමට නොහැකි වීම ප්‍රතිපාදන වෙන්කර තිබුණ භාණ්ඩාගාරයෙන් අක්මුදල් නොලැබීම හේතුවෙන් බැරකම් ලේඛණයෙ ඇතුලත් නොකිරීම, උඩුගත කිරිමේ ඇතිවූ අපහසුතාවක් නිසා 2018.12.31 දින වන විට ගෙවා අවසන් කර ඇති බැරකම් ද New Cigas වෙබ් පිටුවේ දැක්වෙන බැරකම් ප්‍රකාශනයෙ |

| | | |
|---|---|---|
| | | දැක්වීම ආදිය හේතුවෙන් ගිණුම් පියවීම අවසන් වූ පසු එය නිවැරදි කිරීමට නොහැකි විය. මේ වසරේ සිට එවැනි අතපසුවීම් සිදු නොවීමට කටයුතු කරමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රධාන ප්‍රසම්පාදනයන් පිළිබඳ ප්‍රසම්පාදන සැලසුම<br>වාර්ෂික ඇස්තමේන්තු මගින් රු. මිලියන 65 ක ප්‍රතිපාදන සලසා තිබුණු සංවර්ධන කාර්යයන් දෙකකට සහ මූලධන වත්කම් අත්පත්කර ගැනීම සහ පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම යන කාර්යයන්ට අදාල ප්‍රසම්පාදන සැලසුම් වාර්ෂික ක්‍රියාකාරී සැලසුමට ඇතුළත්කර නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 ජේදයේ (ඉ) ප්‍රකාරව සැලැසුම් සකස් කළ යුතුය. | 2019 වර්ෂයේද මෙම කාර්යයෙන් කොටසක් ඉටු කිරීමට ඇති අතර එය 2019 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කරනු ඇත. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නාවික ලේකම් කාර්යාලය විසින්, 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනත හා එහි සංශෝධන මත අය කරනු ලබන අනුකූලතා සහතික, අබන්ධ මුද්‍රා හැරීමේ සහතික හා අනුපිටපත් නිකුත් කිරීමේ ගාස්තු යන ගාස්තු වර්ග තුන හැරුණු විට කාණ්ඩ 10 කට අයත් අනෙකුත් ගාස්තු වර්ග 50 කට අධික සංඛ්‍යාවක් 2006 වර්ෂයෙන් පසුව කිසිදු සංශෝධනට ලක්කර නොතිබුණි. | 2018 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමට අදාල අංක 01/2018 හා 2018 ජනවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි සේවා සම්පාදනයේදී අය කරනු ලබන ගාස්තු සංශෝධනය කිරීමට ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය. | ලේකම්ගේ අනුමැතියෙන් පත් කරන ලද කමිටුවක් විසින් ගාස්තු සංශෝධන කෙටුම්පත සකස් කිරීම අවසන්කර ඇත. 2019 වර්ෂය තුලදී මෙම කාර්යය ඉටුකිරීමට බලාපොරොත්තුවේ. |

## 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යාපනය අර්ධද්වීපය හා දූපත් අතර මගී හා භාණ්ඩ ප්‍රවාහන යාත්‍රා ලියාපදිංචිය, නියාමනය හා අළුත්වැඩියාව සඳහා පහසුකම් සැපයීම තුළින් වෙරළාසන්න මගී ප්‍රවාහන සේවා විධිමත් කිරීමේ අරමුණ ඇතුව 2016 වර්ෂයේදී නාවික ලේකම් කාර්යාලයේ යාපනය දිස්ත්‍රික් උප කාර්යාලය හා දියත් මග (Slipway) ඉදිකිරීම යන ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. අදාල ඉදිකිරීම් 2017 දෙසැම්බර් 31 දිනට අවසන් කිරීමට සැලසුම් කර තිබුණද 2018 දෙසැම්බර් 31 දින වනවිට මූලික ඉදිකිරීම් පමණක් අවසන්ව පැවති අතර 2019 අප්‍රේල් 09 දින වනවිටත් ජලය හා විදුලිය ඇතුළු යටිතල පහසුකම් සංවර්ධන කටයුතු අවසන් නොවීම හේතුවෙන් භාවිතයට ගත නොහැකිවී තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු හා ක්‍රියාකාරී සැලසුමට අනුගතව කටයුතු කර අපේක්ෂිත කාල සීමාවන් තුල ප්‍රතිපාදන උපයෝජනය කර ප්‍රයෝජනට ගැනීමට කටයුතු කල යුතුය. | 2019 වර්ෂයේදී යටිතල පහසුකම් සපයා ගෙන මහජන උපයෝජනය සඳහා යෙදවීමට බලාපොරොත්තුවේ. |

## 3.4 විදේශ ආධාර ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කන්කසන්තුරේ වරාය සංවර්ධනය හා කටයුතු මෙහෙයවීම සඳහා පරිපාලන ගොඩනැගිල්ලක් හා ගුදමක් ඉදිකිරීම සඳහා ඉන්දියානු එක්සිම් බැංකුවේ ණය (Line of Credit) යටතේ 2018 වර්ෂය සඳහා රු. මිලියන 1,350 ක ප්‍රතිපාදන සලසාදී තිබුණි. සමාලෝචිත වර්ෂය තුල ප්‍රසම්පාදන කාර්යයන් හා ඉදිකිරීම් වලින් සියයට 05 ක් අවසන් කිරීමට සැලසුම් කර තිබුණද සැලසුම් කළ කාර්යයන් මූලික මට්ටමේ පැවති අතර මුළු ප්‍රතිපාදනයම ඉතිරිව පැවතුණි. මේ හේතුවෙන් රාජ්‍ය ණය ප්‍රශස්ත උපයෝජනයකට ලක්වී නොතිබුණු බව නිරීක්ෂණය විය. | රාජ්‍ය ණය ප්‍රශස්ත ලෙස උපයෝජනය සඳහා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මතක වීම අමාත්‍යාංශයේ වගකීම වේ. | ප්‍රතිපාදන අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කර නොතිබූ අතර භාණ්ඩාගාරයෙන් රු. මිලියන 1,350 ක් වෙන් කර තිබුණි.<br>මූලික කාර්යයන් වූ ඉඩම් පවරා ගැනීම ව්‍යාපෘති උපදේශකයකු පත්කිරීම හා නාවික හමුදාවේ ගොඩනැගිලි ප්‍රතිෂ්ඨාපනය කිරීම යනාදියේ පැවති ගැටළු හේතුවෙන් වරාය ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද විය. |

## 3.5 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අමාත්‍යාංශයේ මුද්‍රණ කාර්යයක් සඳහා ලංසු කැඳවීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කැඳවිය යුතු අවම මුද්‍රා තැබූ ලංසු ප්‍රමාණය කැඳවා නොතිබීම, මුද්‍රා තැබූ මිල ගණන් කැඳවීම වෙනුවට ෆැක්ස් මගින් හෝ විද්‍යුත් තැපැල(E-mail) මගින් හෝ හෝ අතින් භාරදෙන ලෙස ලංසුකරුවන්ට දන්වා තිබීම, පැහැදිලි පිරිවිතර ඉදිරිපත් කර නොතිබිම, ලංසු විවෘත කිරීමට නියමිත දිනය හා වේලාව සඳහන් කර නොතිබිම හා සම්මත ලේඛන භාවිතා නොකිරීම වැනි අඩුපාඩු නිරීක්ෂණය විය. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දැක්වෙන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කල යුතුය. | අමාත්‍යාංශ විසින් ලංසු කැඳවීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දැක්වෙන මාර්ගෝපදේශයන්ට අනුකූලව වර්තමානයේ කටයුතු කෙරේ. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉංජිනේරුමය අංශ වලට අයත් නාවික වෘත්තිකයන්ගේ පුරප්පාඩු 11 ක්ද ඇතුළුව ජොෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 18 ක් ද, තෘතියික මට්ටමේ තනතුරු 18 ක් සහ ද්වීතියික මට්ටමේ තනතුරු 46 ක පුරප්පාඩු පැවතියද බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශයේ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පවත්වා ගත යුතුයි. | වැටුප් ප්‍රමාණවත් නොවීම හේතුවෙන බඳවා ගැනීමේ අසීරුතාවයක් පවතින අතර පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දන්ව ඇත. |